Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2018 Public Examination**

# Sinhala

## Continuers Level

**Tuesday 23 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2018*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 1**

1. Which specific passengers would be interested in the announcement? Give **two** pieces of information that are important for these passengers. **3**

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 2**

2. (a) Why has the school chosen this particular date to honour Mr Kannangara? **2**

(b) Give **three** reasons why Mr Kannangara’s education policy achieved a high level of success. **3**

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 3**

3. Tomorrow, you have to give a lecture to your class. Identify seven points from what you heard in Text 3 that will help you. **7**

| How to present an interesting lecture | |
|---|---|
| your voice | • clear voice<br>•<br>• |
| presenting the ideas | •<br>•<br>• |
| further strategies to engage the audience | •<br>•<br>• body language |

**Part B** (Questions 4–6)
(15 marks)

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 4**

4. Your friend is starting a new business in Colombo. Send an email to draw attention to **four** financial benefits of shopping at the Sooriya furniture shop, using the information from the advertisement. **4**

   ඔබගේ මිතුරෙක් කොළඹ අලුතින් ව්‍යාපාරයක් ඇරඹීමට යයි. වෙළඳ දැන්වීමේ සඳහන් විස්තර අනුව, සූරිය ලී වෙළඳ සැලෙන් ලී බඩු ගැනීමෙන් ඇති මූල්‍යමය වාසි **හතරක්** පිළිබඳව අවධානය යොමු කරවමින් විද්‍යුත් ලිපියක් යවන්න.



PLEASE TURN OVER

Marks | You may make notes in this space. These notes will NOT be assessed.

**Text 5**

5. Identify and explain examples of how the proverb stated at the beginning of the text was reflected in the conversation between the sister and the brother. **5**

   අක්කා සහ මල්ලී අතර වූ සංවාදයේ දී යොදාගත් උදාහරණ හඳුනා ගෙන, එයින් පාඨයේ මුලින් සඳහන් කළ ප්‍රස්ථාව පිරුළ පිළිබිඹු වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

Marks | You may make notes in this space. These notes will NOT be assessed.

**Text 6**

6. (a) Identify the reasons why, on the occasion of its 75th anniversary, Peradeniya University awarded Dr Danapala a special trophy. **2**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ 75 වන සංවත්සරයේ දී, විශේෂ සම්මානයක් පිරිනැමීමට ආචාර්ය ධනපාල මහතාව තෝරා ගැනීමට හේතු හඳුනා ගන්න.

(b) What specific qualities of the paddy grains introduced by Dr Danapala enabled Sri Lanka to become self-sufficient in rice production? **4**

ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත කිරීමට ආචාර්ය ධනපාල මහතා විසින් හඳුන්වා දුන් වී වර්ගයේ ඇති විශේෂිත වූ ලක්ෂණ මොනවා ද?

**End of Section 1**

BLANK PAGE

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2018 Public Examination

# Sinhala

## Continuers Level

### Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2018

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the question that follows.

**පාසල් සිසුන්ට ‘සිසු සුරක්‍ෂා’ රක්‍ෂණය**

නාමල් සිල්වා

පාසල් සිසුන් සඳහා නොමිලේ වෛද්‍ය රක්‍ෂණ ක්‍රමයක් දියත් කිරීම පසුගිය දා අධ්‍යාපන අමාත්‍යාංශයේ දී සිදු වූ අතර, එහිදී අධ්‍යාපන අමාත්‍යාංශය සහ රක්‍ෂණ සංස්ථාව අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරණු ලැබීය.

‘සිසු සුරක්‍ෂා’ නමින් හඳුන්වන මෙම රක්‍ෂණ ක්‍රමයේ මූලික අරමුණ වන්නේ, රටේ දිළිඳු දෙමව්පියන්ගේ ආර්ථික බරට පිළිසරණක් වීමයි. මෙතෙක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත රජයේ පාසල් සිසුන්ට ලබා දුන් නිල ඇඳුම් සහ පොත් පත් වලට අමතරව, අධ්‍යාපන පද්ධතියට එක් වූ නව අංගයක් වන මෙම වෛද්‍ය රක්‍ෂණ ක්‍රමය විවෘත වන්නේ, නොකඩවා පාසලට පැමිණෙන සිසුන් සඳහා පමණි. එමගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තව දුරටත් පුළුල් කිරීමට හා ශක්තිමත් කිරීමට රුකුලක් වනු ඇතැයි බලාපොරොත්තු වේ.

‘සිසු සුරක්‍ෂා’ රක්‍ෂණ ක්‍රමයේ සුවිශේෂී ලක්‍ෂණයක් වන්නේ, එමගින් රෝගී වූ සිසුන්ට අවශ්‍ය උපකාර ලබා දීම පමණක් නොව, සිසුන් හදිසි අනතුරකින් ආබාධිත වීමක් සිදුවන අවස්ථාවල දී වුව ද දෙමව්පියන්ට හෝ භාරකරුවන්ට මුදල් ආධාර ලබා දීමයි.

මෙම වැඩ සටහන ‘ලෝක ළමා දිනයට’ සමගාමීව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ. මෙම රක්‍ෂණය රජයේ පාසල් සඳහා පමණක් නොවන අතර පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් සහ පිරිවෙන්හි ඉගෙනුම ලබන සිසුන් පවා ආවරණය කරනු ඇත.

මෙම වැඩ සටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම පාසලේ විදුහල්පතිවරුන් සතු වේ.

QUESTION

**Marks**

Identify the new support scheme being introduced for students studying in Sri Lanka. Include its main features and explain how it differs from the existing student aid programs. **5**

8. Read the text and then answer in ENGLISH the questions that follow.

**ඉංග්‍රීසි ඉගෙනීමේ හිණිමග**

රසික මාපා

ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පවතින සමයේ, ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීමට හැකියාව ඇති අයකු විශ්ව දැනුමක් ඇති අයකු ලෙසින් සමාජයේ ගෞරවයට පාත්‍ර විය.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට ප්‍රකාශ වීමෙන් පසුව ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට තිබූ උනන්දුව බොහෝ දුරට අඩු විය. මෑතක් වනතුරු ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ හැදෑරීම අධ්‍යාපනික අවශ්‍යතා පදනම් කර සිදු වූවා විනා ප්‍රායෝගික භාවිතය සඳහා එතරම් භාවිතා වූයේ නැත.

ඉංග්‍රීසි භාෂාව ජාත්‍යන්තර භාෂාවක් බවට පත් වී ඇති බැවින්, වර්තමාන ශ්‍රී ලංකාවේ වඩාත් ඉහළ රැකියාවක නිරත වීමට, රැකියාවල උසස් වීමේ අවස්ථාවන් ලඟා කරගැනීමට සහ විදේශ රැකියා සොයා ගැනීමට ඉංග්‍රීසි භාෂා දැනුම අනිවාර්ය වී ඇත.

පෞද්ගලික පාසල්වල සහ ජාත්‍යන්තර පාසල්වල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට අමතරව වෙනත් විෂයයන් ඉංග්‍රීසියෙන් ඉගැන්වීම, සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා සිදු කෙරුණි. නමුත් දැන් ඉංග්‍රීසි භාෂාවට ඇති ඉල්ලුම නිසා රජයේ පාසල්වල ද ඒ පිළිබඳව අවධානය යොමු වී ඇත.

ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ද වෘත්තීය දැනුම සහ කුසලතා ඉහළ නැංවීම සඳහා විදේශ රට වලින් ප්‍රවීණයන් ගෙන්වා ඔවුන්ව සියළුම දිස්ත්‍රික්කවලට යැවීමට සැළසුම් කර ඇත.

තවද, සමහර පාසල් මගින් සෑම ශ්‍රේණියකම සිසුන් සඳහා විභාග පවත්වා ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම් මට්ටම හඳුනා ගෙන දුර්වල ළමුන් සඳහා උපකාරක පංති ද පවත්වනු ලැබේ.

ආසියානු කලාපයේ වෙනත් රටවල පවා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව විශේෂ උනන්දුවක් ඇති වී තිබේ. එම රටවල් අනුගමනය කරන ක්‍රමවේදයන් පිළිබඳව ද දැනුවත් වී සුදුසු දේවල් පමණක් තෝරා ගෙන අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ද වඩාත් ඵල ප්‍රයෝජන ලබා ගත හැකි වේ.

QUESTIONS

**Marks**

(a) Explain how attitudes to learning English have changed over time in Sri Lanka and why knowledge of English is considered important today. **3**

(b) What two steps have been taken to improve the study of the English language in schools in Sri Lanka? **2**

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 8.

**'ටොප් ට්‍රැවල්' මගින් ශ්‍රී ලංකාවේ සංවිධානය කරන නිවාඩු චාරිකා**

**කඳුකරයේ නිසල විවේකීය නිවාඩුවක් ගත කිරීමට**

නකල්ස් කඳු වැටියේ මනස්කාන්ත කඳු වළල්ල

නිහඬ සොඳුරු නිවාඩුවකට පාරාදීසයක්

නිල්වන් ගස් කොළන් සෙවනේ නැවුම් වාතය ශ්වසනය කරමින් නිසංසලේ ගලා බසින පිරිසිදු දිය දහර වල රස විඳින්න

දිය ඇලි අසල නැවුම් ජල පොකුණු වල පිහිනීමට

ආවේණික පක්ෂීන්ගේ සිත් නළවන ගීත වලට සවන් දෙමින් පරිසරයේ සුන්දරත්වයේ ආශ්වාදය ලබන්න

සිසිල් සෙවනේ සක්මන් කිරීමට හෝ නිසොල්මනේ භාවනා කිරීමට සුදුසු පරිසරයක පිහිටි හුන්නස්ගිරි හෝටලය

ප්‍රදේශයේ නැවුම් එළවළු සහ පලතුරු රස විඳින්න

ආයුර්වේද සම්භාහන මගින් ගතට සුවයක්

**මුහුදු වෙරළේ අසීමිත ක්‍රියා කාරකම් සහිත විනෝදජනක නිවාඩුවක්**

ආරුගම් බොක්කේ පොතුවිල් ප්‍රදේශයේ වෙරළ තීරයේ පිහිටි නිවාඩු නිකේතනය

ලොව පුරා රළ ක්‍රීඩා ලෝලීන් ආකර්ෂණය කරගත් විශාල රළ සහිත මුහුදු වෙරළ

බෝට්ටු පැදීමට හෝ බෝට්ටු චාරිකා යෑමට

වර්ණවත් මසුන් නරඹමින් මුහුදේ කිමිදීමට

වෙනත් බොහෝ ක්‍රීඩා පහසුකම්

මැදියම් රාත්‍රිය වන තුරු රසවත් සංගීතයට සවන් දෙමින් රංගනයට සහ ගායනයට අවස්ථා

විවිධ වට්ටෝරු අනුව පිළියෙල කළ රසවත් මුහුදු ආහාර

ඇඳුම් පැළඳුම් සහ සිහිවටන ආදිය මිළදී ගැනීමට රාත්‍රී වෙළඳ පොළක්

QUESTION

You are planning to take a close relative to Sri Lanka on a holiday. Write an email to your relative, comparing the advertised tours in light of your relative's lifestyle and suggesting one tour, giving reasons for your choice.

ඔබගේ කිට්ටු ඥාතියකු නිවාඩුවක් සඳහා ශ්‍රී ලංකාවට ගෙන යෑමට ඔබ සැළසුම් කර ඇත. ඉහත චාරිකා දැන්වීම් දෙක ඔබගේ ඥාතියාගේ ජීවන රටාවට අනුව සංසන්දනය කර, එයින් එක් චාරිකාවක් යෝජනා කරමින් ඔබගේ තෝරා ගැනීමට හේතු දක්වා, ඔබගේ ඥාතියා වෙත විද්‍යුත් ලිපියක් ලියන්න.

---

You may make notes in this space.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

Sinhala
Continuers Level

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Question 9

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2018 PUBLIC EXAMINATION

# Sinhala
## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2018

**Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. ‘One kind deed will lead to another.’ Write an imaginative short story for a young adult writing competition, reflecting this saying.

    ‘එක් කරුණාවන්ත ක්‍රියාවක් තවත් කරුණාවන්ත ක්‍රියාවකට මුල් වේ.’ මෙම කියමන පිළිබිඹු වන අයුරින් යෞවනයන්ගේ රචනා තරඟයකට ඉදිරිපත් කිරීම සඳහා මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

11. Plastic waste has a devastating effect worldwide. Write a persuasive article for a newspaper, suggesting steps that could be taken to prevent this devastation.

    ලොවපුරා විනාශකාරී බලපෑමක් ඇති කිරීමට ප්ලාස්ටික් අපද්‍රව්‍ය හේතු වී ඇත. මේ විනාශය වැළැක්වීමට ගත හැකි පියවර යෝජනා කරමින් පාඨකයන් සඳහා පුවත්පතකට පොළඹවීමේ ලිපියක් ලියන්න.

12. ‘Technology was developed to help people, but now it has started to control people.’ Write an evaluative script for a speech, indicating how technology has helped people and how it has overtaken them. Your speech is to be presented at your school’s Technology Society meeting.

    ‘තාක්ෂණය මිනිසාගේ පහසුව සඳහා වැඩි දියුණු කරනු ලැබුව ද, දැන් එය මිනිසාව පාලනය කිරීමට පටන් ගෙන ඇත.’ තාක්ෂණය මිනිසාට උපකාර වී ඇති අන්දම සහ එය මිනිසාව අභිබවා ගොස් ඇති අන්දම සඳහන් කරමින්, ඇගැයීමේ කතාවක පිටපතක් ලියන්න. මෙම කතාව ඉදිරිපත් කරනු ලබන්නේ ඔබ පාසලේ තාක්ෂණ සංගමයේ රැස්වීමේ දීය.

You may make notes in this space.

Question Number:

**End of Section 3**